᠎# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2137/6 - 2019 අගෝස්තු මස 19 වැනි සඳුදා - 2019.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය :- IR/10/96/2009

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2011.06.09 දිනැති හා අංක 1709/46 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.05.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කුරුණෑගල, අලුත් මල්කඩුවාව, බිලුම්ෆීල්ඩ් වත්ත, නො. 66 හි පදිංචි ටී. එම්. පියතිලක මයා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, නො. 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.06.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 08 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය :- IR/10/96/2009

**කාර්මික අධිකරණය**

ටී. එම්. පියතිලක මහතා,
අංක. 66, බිලුම්ෆීල්ඩ් වත්ත,
අලුත් මල්කඩුවාව,
කුරුණෑගල.

*පළමු පාර්ශවය.*

නඩු අංකය :A 3377

සහ

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශවය.*

අතර පවතින කාර්මික ආරවුල

### ප්‍රදානය

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2011.05.26 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

### ආරවුලට තුඩුදුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ වාරියපොල පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේ විදුලි අධිකාරි තනතුරෙහි පිළිවෙලින් සේවයෙහි යොදවනු ලැබූ ටී. එම්. පියතිලක හා කේ. ජී. වික්‍රමසිංහ යන දෙදෙනා විසින් සීමාසහිත නෝර්ත් වෙස්ටන් ඇපරල් (පුද්ගලික) ආයතනයට අදාළව මනු කියවීම් වැරදි ලෙස සටහන් කරනු ලැබිය යන චෝදනාව මත දෙදෙනාට විනය නියෝගයන් ක්‍රියාත්මක කිරීමේදී ටී. එම්. පියතිලක මහතාට අසාධාරණයක් සිදුවී ඇත්ද ? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

### පසුබිම

ඉල්ලුම්කරු වන ටී. එම්. පියතිලක මහතා 2011.07.28 වන දින කාර්මික අධිකරණය වෙත ඔහුගේ ඉල්ලුම් පත්‍රය පිටු 03 කින් සමන්විතව ඇ (1) ඇ (2) ඇ(3) යන ලේඛන සහිතව ඉදිරිපත් කර ඇත. 2001.09.29 වන දින විභාගය සඳහා අමතන අවස්ථාවේදී ඉල්ලුම්කරු පෞද්ගලිකව පෙනී සිටි අතර වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් නීති නිලධාරිනි ක්‍රිෂාන්ති සමරවීර මහත්මිය සමඟ නීතිඥ සුජිත් පෙරේරා මහතා පෙනී සිටිමින් උත්තර ප්‍රකාශ ඉදිරිපත් කිරීම සඳහා 2011.10.17 දින ලබා ගන්නා ලදී.

2011.10.17 කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටීමක් ද නොවිය. වග උත්තරකාර පක්ෂය වෙනුවෙන් නීති නිලධාරිනී ක්‍රිශාන්ති සමරවීර මහත්මියත් මානව සම්පත් නිලධාරි ඒ. එම්. එන්. සමීර මහතා සමග නීතිඥ සුජිත් පෙරේරා මහතා පෙනී සිටිමින් උත්තර ප්‍රකාශ සැකසීමට අදාල ලේඛන අවශ්‍ය බැවින් දිනයක් ලබා ගන්නා ලදී. 2011.11.17 වන දින පස්වරු 2.30 ට කැඳවීමට නියම කර ඉල්ලුම්කරුට නොතීසි නිකුත් කරන ලදී. එදිනට කැඳවූ අවස්ථාවේදී වග උත්තරකාර පාර්ශවය පෙනී සිටි අතර කේ. ජී. නවරත්න මහතා ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටින ලදී. 2012.01.16 වන දින විමසීමට ගන්නා අවස්ථාවේදී වග උත්තරකාර පාර්ශවයේ පිළිතුරු ප්‍රකාශය විවෘත අධිකරණයේ ගොනු කරමින් පිටපතක් ඉල්ලුම්කාර පාර්ශවයට ලබා දුනි.

මේ අවස්ථාවේ දී ඉල්ලුම්කරු වෙනුවෙන් සමථයක් ලෙස ඉල්ලුම්කරුට පනවා ඇති වැටුප් වර්ධක තුන අවලම්භනය කොට හිඟ කාලයට 50% ක හිඟ වැටුපක් යෝජනා කරන ලදී. මේ අවස්ථාවේදී වග උත්තරකාර පාර්ශවයට මේ සමථය සම්බන්ධයෙන් සලකා බලා දැනුම් දීමට දිනයක් අවශ්‍ය බව දන්වන ලදී. ඒ අනුව සමථය හෝ විභාගය 2012.03.06 දිනට කල් තබන ලදී. ඉල්ලුම්කරු වෙනුවෙන් වෙනත් විභාග දිනයක් ඉල්ලා සිටියෙන් 2012.05.10 වන දිනට නියම කරන ලදී. 2012.05.10 වන දින දී නීතිඥ සමන් ප්‍රියලාල් මහතාගේ පෞද්ගලික අපහසුතාවයක් නිසා විමසීම 2012.06.08 වන දිනට නියම කරන ලදී.

නඩු විභාගය 2012.06.08, 2012.08.03, 2012.09.08, 2012.10.19, 2012.12.14 යන දින වලදී පවත්වන ලද අතර 2013.04.29 වන දින ඉල්ලුම්කරු වෙනුවෙන් නඩුව ඉල්ලා අස්කර ගන්නා බව දන්වන ලදී. වගඋත්තරකාර පාර්ශවය ද එම ඉල්ලීමට විරුද්ධ නොවන බව දන්වා සිටී.

ප්‍රදානය :-

මෙම විමසීමේ දී ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරු පමණක් මූලික සාක්ෂි දීමෙන් පසු වගඋත්තරකාර පාර්ශවය හරස් ප්‍රශ්න අසන ලදී. ඉල්ලුම්කරුට ඇති අසනීප තත්ත්වයත් දුර බැහැර සිට පැමිණීම හේතුවෙන් අතරමගදී නඩු කටයුතු අවසන් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව මෙම විමසීම නිෂ්ප්‍රභ කිරීමෙන් අවසන් කරන බවට නියෝග කරමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු.

2019.06.24 වන දින කාර්මික අධිකරණයේ දී ය.

9-11

---

මගේ අංකය : - IR/15/02/2012.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2013.03.11 දිනැති හා අංක 1801/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.02.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මොරටුව, කල්දෙමුල්ල, ඊබට් පටුමග, අංක 185/5බී හි පදිංචි එච්. එන්. පෙරේරා මිය, හික්කඩුව, වැවල, හිල් හවුස් (ඒ) හි පදිංචි ලලිතා ලාලනි කොඩිතුවක්කු මිය සහ කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609 හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.06.24

දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 09 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : - IR/15/02/2012

කාර්මික අධිකරණය

1. එච්. එන්. පෙරේරා මිය,
අංක. 185/5බී,
ඊබට් පටුමග,
කල්දෙමුල්ල,
මොරටුව.

2. ලලිතා ලාලනී කොඩිතුවක්කු මිය,
හිල් හවුස් (ඒ),
වැවල,
හික්කඩුව.

නඩු අංකය : A 3505

පළමු පාර්ශවය.

සහ

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09

දෙවන පාර්ශවය.

අතර පවතින කාර්මික ආරවුල

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2013.02.22 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරවුලට තුඩුදුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවය කළ එච්. එන්. පෙරේරා මහත්මියට සහ ලලිතා ලාලනි කොඩිතුවක්කු මහත්මියට ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ සේවකයින්ට උසස්වීම් ලබා දීමේ දී ඔවුන් දෙදෙනාට අසාධාරණයක් සිදුවී ඇත්ද ? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

පසුබිම

ඉල්ලුම්කරුවන් විසින් 2013.04.02 වන දින ලිඛිත සැලකිරීම් ගොනු කරන ලද අතර වග උත්තරකරුවන් විසින් තමන් වෙත පිටපතක් නොලැබුන බව දන්වා සිටියෙන් 2013.04.22 විවෘත අධිකරණයේ දී පැමිල්ලේ පිටපත භාර දුනි. 2013.05.13 වන දින වන විට ලිඛිත සැළකිරීම් ගොනු කළ යුතු බවට දන්වන ලදී. ඒ අනුව විභාගය 2013.05.29 වන දිනට නියම කරන ලදී. වගඋත්තරකාර පක්ෂය මෝසමක් ගොනු කරමින් තවත් සති දෙකක කාලයක් උත්තර ප්‍රකාශය ගොනු කිරීම සඳහා අවශ්‍ය බව දන්වන ලදී. 2013.05.27 වන දින උත්තර ප්‍රකාශය ගොනු කරන ලදී.

2013.05.29 වන දින විමසීමට ගත් අවස්ථාවේදී වග උත්තරකාර ආයතනයේ ප්‍රකාශය 2013.05.27 වන දින ගොනු කරන ලද බවත් උත්තර ප්‍රකාශයේ පිටපතක් ඉල්ලුම්කාර පාර්ශවයේ නියෝජිත වෙත භාර දුනි. පිළිතුරු සැපයීමට අවශ්‍ය වන්නේ නම් සති දෙකක් තුළ වග උත්තරකාර පාර්ශවයට ද පිටපතක් සහිතව ලේඛකාධිකාරි වෙත යොමු කරන ලෙස දන්වන ලදී. විමසීම සඳහා 2013.06.20 වන දිනට නියම කරන ලදී. ඉල්ලුම්කරුවන්ගේ දෙවන ප්‍රකාශය 2013.06.03 වන දිනට ගොනු කර ඇත. 2013.06.20 වන දින කැඳවනු අවස්ථාවේදී වගඋත්තරකරුවන්ගේ නීතිඥවරයාට පැමිණිය නොහැකි බවට මෝසමකින් දන්වා ඇත.

2013.07.30 වන දින විමසීම අරඹන ලදී. පළවෙනි ඉල්ලුම්කාරිය මූලික සාක්ෂි දෙමින් ලේඛන ගණනාවක් ලකුණු කරන ලදී. 2013.08.29 වන දින වැඩිදුර සාක්ෂි ලබා ගත් අතර 2013.10.30 වන දින හා 2013.11.22 වන දින පළමුවැනි ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. එකී පළමුවෙනි ඉල්ලුම්කාරියගෙන් නැවත ප්‍රශ්න අසා වැඩිපුර විභාගයට නියම කරන ලද අතර 2014.03.28 වන දින දෙවන ඉල්ලුම්කාරිය සාක්ෂියට කැඳවන ලදී. එදිනම මූලික සාක්ෂි අවසන් කිරීමෙන් පසුව හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. 2014.05.02 වන දින දෙවන ඉල්ලුම්කාරියගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසන ලදී. එදිනම නැවත ප්‍රශ්ණ අවසන් කිරීමෙන් පසුව A/1 සිට A/12 දක්වා ලේඛන ලකුණු කිරීමෙන් නඩුව අවසන් කරන ලදී. 2017.07.04 වන දින වගඋත්තරකරුවන් වෙනුවෙන් ප්‍රියන්ත පුෂ්ප කුමාර වැලිකල මානව සම්පත් විධායක සහකාර සාක්ෂියට කැඳවන ලදී. මෙම නඩුවේ දී ඉල්ලුම්කරුවන්ගේ ස්ථාවරය වූයේ පළවෙනි පැමිණිලිකාරිය වන එච්. එන්. පෙරේරා මහත්මිය 1978.04.03 වන දින B/3 ශ්‍රේණියේ ගිණුම් ලිපිකරුවෙකු වශයෙන් සේවයට බැඳී 1986 දී B/2 ශ්‍රේණයට උසස්වීමක් ලැබූ බවත් ගත වූ වසර 17 තුළ දේශපාලන බලපෑම් මත උසස්වීම් නොලැබුණු බවයි. B/2 සිට A/7 දක්වා උසස්වීම් දෙකක් ලබා දිය යුතු බවට පාර්ලිමේන්තු නිල වාර්තාව මත පෙනී යන බවත් එමඟින් බලවත් අසාධාරණයක් වී ඇති බවයි.

දෙවන පැමිණිලිකාරිය වූ ලලිතා මාලනී කොඩිතුවක්කු පුරා වසර 30ක අඛණ්ඩ සේවයක් සපුරා තිබුණ ද A/7 ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලබා තිබුනද යටත් පිරිසෙයින් A/6 ශ්‍රේණියට උසස්වීම් ලබා දී නොතිබුණි. වගඋත්තරකාර පාර්ශවයේ ඒකායන ස්ථාවරය වූයේ වගඋත්තරකාර ආයතනය නිසි ප්‍රතිපත්තිය සහ ක්‍රියා පිළිවෙත අනුව කටයුතු කරන බවත් දේශපාලන පළිගැනීම් හෝ වෙනත් කිසිදු බලපෑමක් සිදු නොවුන බවත් කියා පෑමටය.

කෙසේ වුවත් මෙම නඩුවේදී වගඋත්තරකාර පක්ෂය උත්සහා කළේ සාක්ෂිකරුවන් දිගින් දිගටම හරස් ප්‍රශ්ණ මඟින් අපහසුතාවයට ලක් කිරීමටත්, කාලය මිඩංගු කිරීමටත් පමණි.

සමස්ත නඩු විභාගය පුරාම පැහැදලි වූයේ පිරිස් බල සැකැස්ම හෝ ප්‍රතිපත්තිමය තීරණ මත උසස්වීම් ලබා දෙන බවක් නොව දේශපාලන බලපෑම් වලට අමතරව අධිකරණමය නඩු තීන්දුවක් ලබා දුනහොත් ඒ මත උසස්වීම් ලබා දෙන බවයි. උපාලි ඉන්ද්‍රවංශ හා දංගල්ල යන අයට එකවර උසස්වීම් ලබා දුන්නේ අභියාචනාධිකරණයේ නඩු තීන්දුවක් අනුව බව ප්‍රත්‍යක්ෂ විය.

ඉල්ලුම්කරුවන් ද ශ්‍රේෂ්ඨාධිකාරණයට ඉදිරිපත් කරන නඩුවකට පාර්ශව කරුවන් වශයෙන් සිටි බව පිළිගත්ත ද ඊට අනුකූලව උසස්වීම් ලබා දී නොතිබුණි. වගඋත්තරකාර පාර්ශවය පිටු 16කින් සමන්විත ලිඛිත සැලකිරිමක් ඉදිරිපත් කර තිබුන ද එමඟින් පැමැණිල්ලේ ස්ථාවරය වෙනස් කිරීමට හෝ බලපෑම් අඩු කිරීමට සමත් නොවූ බවට තීරණය කරමි. පැමිණිලි පක්ෂය විසින් ඉල්ලීමට අදාලව ඉදිරිපත් කල කරුණු අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ ආයාචනය පරිදි උසස්වීම් ලබාදීම සාධාරණ හා යුක්ති සහගත බවයි.

**ප්‍රදානය** :-

1) වර්ෂ 2006 සිට සියලු හිඟ වැටුප් සහිත A/7 ශ්‍රේණියට ද වර්තමානයේ ලැබිය යුතුව තිබූ A/6 සහ A/5 ශ්‍රේණියන්ට අදල හිඟ වැටුප් ලබා දීමට නියෝග කරමි.

2) නඩු ගාස්තු වශයෙන් එක් ඉල්ලුම්කාරියකට රුපියල් පනස් දහස (රු. 50,000/-) බැගින් නඩු ගාස්තු ද හිමි විය යුතු බවට තීරණය කරමි.

**සටහන**

මෙම බේරුම්කරණ විභාගයට සැහෙන කාලයක් ගත වූයේ දෙපාර්ශවයම වරින් වර දින ඉල්ලා කරන ලද ඉල්ලීම් වල ප්‍රතිඵලයක් හැටියට ය. විශේෂයෙන් ම මෙම ප්‍රදනය සකස් කොට ඉදිරිපත් කිරිම ප්‍රමාද වූයේ නොවැළැක්විය හැකි ඇති පෞද්ගලික හේතූන් නිසා බවත් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවයටම කිසියම් අපහසුතාවයක් වූයේ නම් ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව අතිශයින්ම කණගාටුවට පත් වෙමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු.

2019.06.24 වන දින,
කාර්මික අධිකරණයේ දී ය.

9-12

මගේ අංකය : - IR/COM/05/W/2015/145.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2127/6 දරන හා 2019.06.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධයට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශනේ පන්නිපිටිය, ඇරැව්වල, අංක 650/ඒ/3 හි පදිංචි කේ. එල්. සී. හරේන්ද්‍ර මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 07, බෞද්ධාලෝක මාවත පිහිටි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A23/2017 දරන හා 2019.04.25 දිනැති ප්‍රදනය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

ඒ හෙයින් අංක A 23/2017 දරන බේරුම්කාර ප්‍රදනය ක්‍රියාත්මක වීම 2020.06.10 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 09 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**පළමුවැනි උපලේඛනය**

''අ'' ආකෘතිය

(*3 වන නියෝගය*)

1950 අංක 43 දරන කාර්මිල ආරවුල් පනත

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය : ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

දිනය : 2019 ජූලි මස 12 දින දී ය.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2019 ජුනි මස 10 දිනැති අංක 2127/06 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූ ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ කේ. එල්. සී. හරෙන්ද්‍ර බැඳී සිටින්නාවූ ද, 2019 අප්‍රේල් මස 25 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පිටපත : කේ. එස්. සී. හරෙන්ද්‍ර මයා,
අංක 650/ඒ/3, ඇරැව්වල,
පන්නිපිටිය

1) ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තී සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම යැවිය යුතු ය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවා යෝජිකයෙකු, වෘත්තිය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවායෝජිකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තිය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතු ය.

09 - 13

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.